**මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩය-3 සේවා ගණය (MT -1-2025 ) (තාක්ෂණික සහයක -කෘෂි ව්‍යාප්ති ) III ශ්‍රේණිය සඳහා වන විවෘත බඳවා ගැනීම - 2025**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩය - 3 සේවා ගණය (MT-1-2025 ) (තාක්ෂණ සහයක - කෘෂි ව්‍යාප්ති) III වන ශ්‍රේණියේ තනතුරට අදාළ පුරප්පාඩු පිරවීම සඳහා මධ්‍යම පළාත තුළ පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

## 02. වැටුප් පරිමාණය

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MT 01-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර ,එයට අදාළ වැටුප් පරිමාණය රු. 50,090 – 10X540 – 11X630 – 10X1010 – 10X1190 – 84,420/- ක් වන අතර, පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

## 03. සේවා කොන්දේසි

3.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.

3.2 මෙම තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත් කරනු ලැබේ.

3.3 තනතුරට බඳවා ගැනීමෙන් පසු මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩය - 3 සේවා ගණය (MT 1-2016) (තාක්ෂණ සහයක -කෘෂි ව්‍යාප්ති) සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ දැක්වෙන ආකාරයට අදාළ කාර්යක්ෂමතා කඩඉම් හා රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගවලින් සමත්විය යුතුය.

3.4 මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 05ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර, එම කාලය තුළදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ. තවද, පත් කරනු ලබන සේවා ස්ථානයේ වැඩ භාරගත් දින සිට අවුරුදු 03ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය.

3.5 මෙම තනතුරට බඳවා ගැනීමෙන් පසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට, මධ්‍යම පළාත් මූල්‍ය රීති සංග්‍රහයට, මධ්‍යම පළාත් තාක්ෂණික සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රයට, කාර්ය පරිපාටික රීති සංග්‍රහයටද, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලටද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලටද අනුව කටයුතු කළ යුතුය.

**04.** **පුරප්පාඩු පවත්නා ක්ෂේත්‍රයන්**

4.1 මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩය - 3 සේවා ගණය (MT 1-2025) (තාක්ෂණ සහයක -කෘෂි ව්‍යාප්ති) III ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර, මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

4.2 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2026.02.13 දින වේ. අයදුම් කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් 2026.02.13 දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

**05.** **සුදුසුකම්**

5.1 අධ්‍යාපන සුදුසුකම්

භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය සහ විද්‍යාව ඇතුළුව, දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

5.2 වෘත්තීය සුදුසුකම්

I. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2012 ප්‍රකාරව අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් වල 05 වන මට්ටමේ පාඨමාලා සහතිකය (NVQ) ලබා තිබීම

හෝ,

II. තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඒ හා සමාන යැයි පිළිගනු ලබන සුදුසුකමක් ලබා තිබීම

5.3 පළපුරුද්ද - අදාළ නොවේ.

5.4 කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් යෝග්‍ය වන යහපත් කායික, මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

5.5 වෙනත් සුදුසුකම්

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2026.02.13) පූර්වාසන්නයෙන් වූ වසර 03ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. (අයදුම්කරු මෙම පළාතේ වසර 03කට වඩා ස්ථිර පදිංචි අයෙකු සමඟ විවාහ වූ විට කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සලකා බැලේ.)

IV. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම තනතුරුවලට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් නොලබයි.

V. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව 2026.02.13 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

## 06. වයස් සීමාව

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2026.02.13 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

## 07. විභාගය පිළිබඳ විස්තර

I. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

II. අපේක්ෂකයා විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

III. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතුය.

IV. විභාග මධ්‍යස්ථානය - මහනුවරදී පමණක් පවත්වනු ලැබේ.

08. බඳවා ගැනීමේ ක්‍රමය :- ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත තරග විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.ලකුණු ප්‍රමුඛතාව අනුව පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබා ගත් සුදුසුකම් ලත් අපේක්ෂකයන් සිටී නම් හා එම පුරප්පාඩු ද පිරවීමේ සේවා අවශ්‍යතාවයක් තත්කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් අතුරින් වැඩිදුර තෝරා ගැනීමක් සිදු කිරීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2024 හි දෙවන ඡේදයේ සඳහන් 1 කොටස පරිදි අදාළ තෝරා ගැනීම් සිදු කරනු ලබයි.

## 09. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2.විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | පැය 01 | 100 | 40% |

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලත්වය, සිතීමේ, විශ්ලේෂණ තත්වයන්, තීරණය කිරීමේ ශක්තිය, විනිශ්චය කිරීම සඳහා වූ වාස්තවික ව්‍යුහගත ප්‍රශ්න වලින් යුක්තය. |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | 1. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂි කර්මාන්තයේ දායකත්වය<br>1.1. දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය,<br>1.2. රැකියා වියුක්තිය,<br>1.3. කෘෂිකර්මාන්තයේ අපනයන හා ආනයන තත්වය .<br><br>2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම<br><br>3. පස හා ශාක පෝෂණය<br>3.1. පසේ ව්‍යුහය, වයනය, භෞතික හා රසායනික ලවණතාවය හා බෝග වගාව කෙරෙහි බලපෑම<br>3.2. ශාක පෝෂණය පාංශු / ශාක පෝෂණය කළමණාකරණය<br>3.3. පැලෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු<br><br>4. වී නිෂ්පාදනය<br>4.1. පාංශු දේශගුණික අවශ්‍යතාවය<br>4.2. ප්‍රභේද<br>4.3. බිම් සකස් කිරීම හා තවාන් පාලනය<br>4.4. පළිබෝධ හා රෝග මර්දනය<br>4.5. පොහොර යෙදීම<br>4.6. ජල කළමණාකරණය/අස්වනු වැඩිකර ගැනීමේ නූතන ක්‍රමවේදය<br>4.7. අස්වනු නෙළීම හා පසු අස්වනු තාක්ෂණය<br><br>5. වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය<br>5.1. ලොකුළූනු, මිරිස්, අර්තාපල්, බඩඉරිඟු, සහ වෙනත් බෝගවල ප්‍රභේද |

6. එළවළු නිෂ්පාදනය
   - 6.1. එළවළු තවාන් පාලනය
      - 6.1.1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඇති එළවළු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු, අස්වනු නෙලීම හා සැකසීම

7. පළතුරු
   - 7.1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඇති පළතුරු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු,
   - 7.2. අස්වනු නෙලීම හා සැකසීම

8. බෝග ආරක්ෂණය
   - 8.1. බෝග වගාවට වැළඳෙන ප්‍රධාන රෝග හා පළිබෝධ හඳුනා ගැනීම ඒවායේ පාලන විධි
   - 8.2. වල් මර්දනය, වල් මර්දන ක්‍රම
   - 8.3. පළිබෝධ නාශක පාලනයේ දී පිළිපැදිය යුතු ආරක්ෂිත ක්‍රම

9. ජල වහනය හා එහි වැදගත්කම

10. පාංශු රසායන
   - 10.1. පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම

11. වාරිමාර්ග හා ජල කළමණාකරණ
   - 11.1 විවිධ භෝග වර්ග සඳහා උචිත ජල සම්පාදනය ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය
   - 11.2 ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම

12. ගොවිපල් යාන්ත්‍රිකරණය
   - 12.1 ගොවිපල් යාන්ත්‍රිකරණයේ වාසි අවාසි
   - 12.2 බිම් සකස් කිරීමට භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ
   - 12.3 ජල සම්පාදනය හා පැලෑටි ආරක්ෂණය සඳහා භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ
   - 12.4 ඉහත යන්ත්‍ර ක්‍රියාකරවීම හා නඩත්තුව

13. මී මැසි පාලනය
   - 13.1.ආර්ථීක වැදගත්කම
   - 13.2.මී මැසි ගෘහ ආරම්භ කිරීම හා පවත්වා ගෙන යාම
   - 13.3.අස්වනු ලබා ගැනීම හා වෙළඳ පොළට සකස් කිරීම

14. මල් වගාව හා භූමි අලංකරණය
    14.1.ආර්ථික වැදගත්කම
    14.2.භූමි අලංකරණ ක්‍රම
    14.3.වෙළඳපොළ සඳහා කැපූ මල් නිෂ්පාදනය හා ඒවා වෙළඳපොළට සකස් කිරීම

15. ආරක්ෂිත බෝග වගාව
    15.1.වැදගත්කම
    15.2.සැලසුම් කිරීම
    15.3.බෝග තෝරා ගැනීම
    15.4.පවත්වාගෙන යාම හා අස්වනු සකස් කිරීම

16. සත්ත්ව පාලනය
    16.1.කුකුල් පාලනය හා කිරි ගව නිෂ්පාදනය
    16.2.සමෝදාන ගොවිපල් පාලනය යටතේ ඉහත සඳහන් සත්ත්ව නිෂ්පාදන පවත්වා ගැනීම

17. කෘෂිකාර්මික ව්‍යාප්තිය
    17.1. කෘෂිකාර්මික ව්‍යාප්ති උපාය මාර්ග හා ක්‍රම වේදය
    17.2. කෘෂිකාර්මික ව්‍යාප්ති සන්නිවේදන ක්‍රම

18. පටක රෝපණය
    18.1.පටක රෝපණයේ මූලික සිද්ධාන්ත හා අතිත තොරතුරු පිළිබඳ දැනුම ,
    18.2.පටක රෝපණයේ භාවිතයන් / යෙදීම්, උදාහරණ ,
    18.3.පටක රෝපණයේ වාසි අවාසි ,

19. පැලෑටි නිරෝධායනය පිළිබඳ දැනුම
    19.1.පැලෑටි නිරෝධායන රෙගුලාසි පිළිබඳ දැනුම ,
    19.2.පැලෑටි නිරෝධායන ක්‍රම ,

20. ශාක සංරක්ෂණය
    20.1.ශාක සංරක්ෂණයේ වැදගත්කම (ශාක /ජාන ප්ලාස්ම)
    20.2.ශාක සංරක්ෂණ ක්‍රම ( ශාඛ /ජාන ප්ලාස්ම)

21. ජෛව තාක්ෂණය
    21.1.DNA වල වැදගත්කම
    21.2.ජානය යනු කවරක්ද , එහි ක්‍රියාකාරිත්වය
    21.3.ජාන ඉංජිනේරු ශිල්ප ක්‍රම මඟින් ශාක වැඩිදියුණු කිරීමට ඇති හැකියාව

| | |
|---|---|
| | 22. කෘෂිකර්ම සංවර්ධනය - <br>වර්තමාන කෘෂිකර්ම සංවර්ධන ප්‍රතිපත්ති, ඒවායේ ඇති වැදගත්කම, කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන්, කෘෂිකර්ම සංවර්ධනය හා සම්බන්ධ රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන, මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන, ඒකක හා ඒවායේ කාර්යභාරය, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්තමාන ගැටළු හා අභියෝග, කෘෂිකාර්මික සංවර්ධනය රටේ සංවර්ධනයට ආධාරවන ආකාරය, කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්වල යහපත් හා අයහපත් බලපෑම් . |

## 10. අයදුම්කළ යුතු ක්‍රමය

I. අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිත කරමින් A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 03 තෙක් පළමු පිටුවටද, අංක 04 සිට 06 තෙක් දෙවන පිටුවටද, අංක 07 සිට 11 තෙක් තෙවන පිටුවටද, ඉතිරිය සිවුවන පිටුවටද, වන සේ සකස් කළ යුතුය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අයදුම්පත්‍ර, අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර සහ නිවේදනයේ සඳහන් පරිදි මූලික සුදුසුකම් නොමැති බව අයදුම්පත්‍රයේ තොරතුරු අනුව පෙනී යන්නේ නම් ද කිසිදු දැනුම්දීමකින් තොරව එම අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ඔබ ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

II. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය.

III. සෑම අපේක්ෂකයෙකුම රු 600.00 ක විභාග ගාස්තුවක් මධ්‍යම පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන පරිදි අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම **ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට** මුදලින් ගෙවා, ඒ සඳහා ලබාගත් නිල් පැහැති ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. වෙනත් ශීර්ෂයකට ගෙවීම් කරන ලද කුවිතාන්සි හෝ මධ්‍යම රජයට අයත් කහ පැහැති කුවිතාන්සි අලවා ඇතොත් එම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. එකී ලදුපත නොමැතිව යොමුකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, විභාගය සඳහා ගෙවන ලද විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත හෝ නැවත ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ

මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.ඔබ විසින් අයදුම්පතෙහි සඳහන් කොට ඇති භාෂා මාධ්‍ය කිසිදු අවස්ථාවක වෙනස් නොකෙරේ.

IV. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ශ්‍රේණිගත කිරීමට අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්කල යුතුය.

V. අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට **2026.02.13** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **'ලේකම්,මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර'** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩය - 3 සේවා ගණය (MT-1-2025 ) (තාක්ෂණ සහයක-කෘෂි ව්‍යාප්ති) III වන ශ්‍රේණියට බඳවා ගැනීම "**යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ. අයදුම්කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියළු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසු ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

VI. අයදුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලිපියක් හෝ තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි පිළිබඳ සලකා බලනු නොලැබේ.

VII. අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

VIII. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විසින් මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව අදාළ සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැතිබව අනාවරණය වුවහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

IX. විභාග මධ්‍යස්ථානය පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍රය මඟින් දැනුම් දෙනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.cp.gov.lk** මඟින් පළකරනු ඇත. ප්‍රවේශපත්‍ර විභාගය පැවැත්වීමට දින 14කට පෙර අයදුම්කරුවන්ගේ අයදුම්පතෙහි සඳහන් ජංගම දුරකථන අංකය වෙත කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපෑල මඟින් යොමු කරනු ලැබේ.

X. නිවේදනය පළවී දින 04ක් 05ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියද අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ විභාග අංශය වෙතින් විමසිය යුතුය.
( දුරකථන අංකය 081 – 2213097 )

11. විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත.

12. විභාගයට පෙනී සිටින සියළුම විභාග අපේක්ෂකයන් තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේදී පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

13. **අපේක්ෂකයාගේ අනන්‍යතාවය**

මෙම විභාගයට අයත් සෑම විෂයය පරීක්ෂණයකදීම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් තම අනන්‍යතාව ඔප්පු කර සිටීමට අයදුම්කරුවන් ක්‍රියා කළ යුතුය. මේ සඳහා පහත දැක්වෙන කවර හෝ එක ලියවිල්ලක් ප්‍රමාණවත් වේ.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
- වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.
- වලංගු විදේශ ගමන් බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව කහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග නොපැළඳ දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරගනු නොලැබේ. තවද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි වන පරිදි මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

14. **සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම**

14.1. අයදුම්පත පිරවීමේදි ඉතා සැලකිලිමත් විය යුතු අතර මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුවද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

14.2. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලෙකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව අනාවරණය වුවහොත් හෝ ඔහු /ඇය වෙත තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීම අහෝසි කිරීමට හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයෙන් පහකිරීමට වුවද යටත් වේ.

15. අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.cp.gov.lk** මගින් පළ කරනු ඇත.

16. මෙම නිවේදනයේ ආවරණය වන/නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද මෙම විභාගය පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම/ තීරණය කිරීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

17. මෙම බඳවා ගැනීම සම්බන්ධ විස්තර මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.cp.gov.lk** හි පළකර ඇති අතර, අදාළ අයදුම්පත්‍රය එහිදී බාගත කරගත හැකිය.

18. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වෙනු ඇත.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

2026 ජනවාරි මස ...... වැනි දින
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

සුජානි ආර්.විජේතුංග,
ලේකම් (රා.ආ) ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.